# 5

# විදේශීය අංශයේ ප්‍රවණතා

කොවිඩ්-19 වසංගතයේ බලපෑම් පිළිබිඹු කරමින් විදේශ විනිමය ලැබීම් අඩාල වීම සහ විදේශ ව්‍යවහාර මුදලින් සිදු කළ ණය සේවාකරණ වගකීම් ඉහළ යෑම හමුවේ, 2021 වසරේ දී විදේශීය අංශය දැඩි අභියෝගවලට මුහුණ දුන්නේය. 2021 වසරේ මේ දක්වා කාලපරිච්ඡේදය තුළ වෙළඳ භාණ්ඩ අපනයන ආදායම සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම සහ ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම පිළිබිඹු කරමින්, ආනයන සඳහා වන වියදම ද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2019 සහ 2020 වසරවල අනුරූප කාලපරිච්ඡේදවලට සාපේක්ෂව, 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ වෙළඳ හිඟය පුළුල් විය. සේවා වෙළඳාම, විශේෂයෙන්ම සංචාරක ඉපැයීම්, වසංගතය හේතුවෙන් සැලකිය යුතු ලෙස බලපෑමට ලක් විය. 2021 වසරේ ජනවාරි සිට මැයි දක්වා කාලපරිච්ඡේදය තුළ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත හිතකර වර්ධනයක් වාර්තා කළ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ඉන්පසුව මන්දගාමී විය. පොලී සහ ලාභාංශ ගෙවීම් යම් අඩුවීමක් පෙන්නුම් කළ අතර එමගින් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය සාපේක්ෂ වශයෙන් අඩු විය. වෙළඳ හිඟය පුළුල් වීම සහ සේවා වෙළඳාමේ මන්දගාමීත්වය පිළිබිඹු කරමින් විදේශීය ජංගම ගිණුමේ හිඟය පුළුල් විය. මූල්‍ය ගිණුම, ශුද්ධ විදේශීය ගෙවීම් වාර්තා කළ අතර, දළ නිල සංචිත ප්‍රමාණය පහත වැටුණි. 2021 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන කාලපරිච්ඡේදය තුළ ගෙවුම් තුලනයේ සමස්ත ශේෂයේ සැලකිය යුතු හිඟයක් වාර්තා විය. කෙසේ වෙතත්, රජය සහ මහ බැංකුව දැනට සිදු කරගෙන යන ප්‍රයත්නයන් සමඟ, කෙටි කාලීනව සැලකිය යුතු මට්ටමේ විදේශ විනිමය ලැබීම් අපේක්ෂා කරන අතර, ඌන උපයෝජිත හෝ උපායමාර්ගික නොවන වත්කම්වලින් මුදල් ඉපැයීම, ද්විපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු ගිවිසුම්, ඒකාබද්ධ ණය පහසුකම්, රජයකින් රජයකට මූල්‍යනයන් ලබා දීම් සහ විදේශීය ඍජු ආයෝජන ප්‍රවාහ ඒ අතර ඇතුළත් වේ. විනිමය අනුපාතිකය 2021 වසරේ මේ දක්වා කාලපරිච්ඡේදය තුළ යම් විචලනයන් පෙන්නුම් කළ අතර, මෑත සතිවල දී සාපේක්ෂ වශයෙන් ස්ථාවරව පැවතුණි. ඇතැම් අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා වන වියදම් පියවීමට විදේශ විනිමය ද්‍රවශීලතාව ලබා දෙමින්, විනිමය අනුපාතිකයෙහි අධික විචලනයන් අඩු කිරීම සඳහා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් විය.

## 5.1 ගෙවුම් තුලනය


### ජංගම ගිණුම

2021 වසරේ පළමු භාගයේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල වර්ධනයන් පැවතිය ද, වෙළඳ හිඟය පුළුල් වීම, සංචාරක ඉපැයීම් පහළ යෑම හමුවේ සේවා වෙළඳාමේ අතිරික්තය අඩු වීම හේතුවෙන් ජංගම ගිණුමේ හිඟය පුළුල් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ජංගම ගිණුම 2020 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 1.1ක හිඟයට සාපේක්ෂව, 2021 වසරේ පළමු භාගයේ දී එ.ජ. ඩොලර් බිලියන 1.5ක හිඟයක් වාර්තා කළේය.

### වෙළඳ ගිණුම


වෙළඳ ගිණුමේ හිඟය, 2020 සහ 2019 වසරවල අනුරූප කාලපරිච්ඡේද තුළ වාර්තා වූ පිළිවෙළින්, එ.ජ. ඩොලර් බිලියන 3.8 සහ එ.ජ. ඩොලර් බිලියන 4.9 සිට 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ දී එ.ජ. ඩොලර් බිලියන 5.5ක් දක්වා පුළුල් විය. 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ ලැබුණු අපනයන ආදායම, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් බිලියන 7.9ක් දක්වා 22.6%කින් ඉහළ ගියේය. පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ එ.ජ. ඩොලර් බිලියන 10.3ක් වූ ආනයන වියදම, 30.7%ක වර්ධනයක් වාර්තා කරමින් 2021 වසරේ ජනවාරි-අගෝස්තු කාලපරිච්ඡේදය තුළ එ.ජ. ඩොලර් බිලියන 13.4ක් දක්වා ඉහළ ගියේය. අපනයන හා ආනයනවල පරිමා සහ ඒකක මිල දර්ශකයන්හි විචලනයන් මගින් පෙන්නුම් කරන පරිදි, අපනයන ආදායම ඉහළ යෑම සඳහා අපනයන පරිමාවන් ඉහළ යෑම සැලකිය යුතු ලෙස හේතු විය. විවිධ ආනයන සඳහා පරිමාව සහ මිල ගණන් වෙනස්වීම්වලින් සිදු කරන

**5.1 රූප සටහන**
**විදේශ වෙළඳාමේ ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි. ඕ. සී. සමාගම
අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව


**5.2 රූප සටහන**
**වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දර්ශක**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

> ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහාය සහ ගෝලීය ක්‍රියාකාරකම් ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට පත් වීම හේතුවෙන් අපනයන ආදායම වසංගතයට පෙර පැවති මට්ටම් කරා යථා තත්ත්වයට පත් වූ අතර, දේශීය ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීම සහ ගෝලීය භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ආනයන වියදම් ඉහළ ගියේය...

**5.3 රූප සටහන**
**2021 ජන.-අගෝ. කාලපරිච්ඡේදය තුළ ද්විපාර්ශ්වික වෙළඳ ශේෂයන්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.1 සංඛ්‍යා සටහන**

## විදේශ වෙළඳාමේ ප්‍රවණතා

එ.ජ.ඩො. මිලියන

| කාණ්ඩය | 2019 | 2020 (අ) | 2020 ජන.-අගෝ. (අ) | 2021 ජන.-අගෝ. (අ) | වාර්ෂික වෙනස්වීම % ජන.-අගෝ. 2020/2021 | දායකත්වය ජන. - අගෝ. 2021 |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **2,461.9** | **2,336.2** | **1,516.0** | **1,765.5** | **16.5** | **22.3** |
| තේ | 1,346.4 | 1,240.9 | 805.6 | 882.4 | 9.5 | 11.2 |
| රබර් | 24.2 | 30.1 | 17.9 | 27.3 | 52.7 | 0.3 |
| පොල් | 329.5 | 345.2 | 221.5 | 276.9 | 25.0 | 3.5 |
| පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත | 161.1 | 163.1 | 101.4 | 125.6 | 23.9 | 1.6 |
| වෙනත් | 168.4 | 182.1 | 120.1 | 151.3 | 26.0 | 1.9 |
| කුළුබඩු | 312.5 | 333.5 | 194.5 | 282.4 | 45.2 | 3.6 |
| එළවළු | 32.0 | 36.6 | 26.1 | 18.4 | -29.7 | 0.2 |
| සකස් නොකළ දුම්කොළ | 34.7 | 25.5 | 16.9 | 21.4 | 26.6 | 0.3 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 120.0 | 134.7 | 100.3 | 91.1 | -9.1 | 1.2 |
| මුහුදු ආහාර | 262.5 | 189.8 | 133.2 | 165.5 | 24.3 | 2.1 |
| **කාර්මික අපනයන** | **9,426.3** | **7,672.0** | **4,905.5** | **6,093.2** | **24.2** | **77.1** |
| රෙදිපිළි හා ඇඟලුම් | 5,596.5 | 4,423.1 | 2,853.1 | 3,434.8 | 20.4 | 43.5 |
| රබර් නිෂ්පාදිත | 866.1 | 786.1 | 488.9 | 681.7 | 39.4 | 8.6 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 521.1 | 373.6 | 268.1 | 294.9 | 10.0 | 3.7 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 447.0 | 464.0 | 302.9 | 354.0 | 16.9 | 4.5 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 400.0 | 337.5 | 209.5 | 329.1 | 57.1 | 4.2 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 305.7 | 181.5 | 102.7 | 178.0 | 73.4 | 2.3 |
| මූල ලෝහ හා උපාංග | 176.5 | 110.9 | 76.0 | 100.1 | 31.8 | 1.3 |
| ප්‍රවාහන උපකරණ | 145.9 | 71.4 | 46.2 | 74.8 | 61.8 | 0.9 |
| රසායනික නිෂ්පාදිත | 176.3 | 172.7 | 107.7 | 143.7 | 33.4 | 1.8 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 102.9 | 53.9 | 38.2 | 33.8 | -11.4 | 0.4 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 48.3 | 47.9 | 25.9 | 35.5 | 37.0 | 0.4 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 73.5 | 176.3 | 72.6 | 50.7 | -30.2 | 0.6 |
| අනෙකුත් කාර්මික අපනයන | 566.6 | 473.2 | 313.7 | 382.3 | 21.8 | 4.8 |
| **ඛනිජ අපනයන** | **33.9** | **25.1** | **14.3** | **30.7** | **115.3** | **0.4** |
| **වර්ග නොකළ අපනයන** | **17.9** | **14.1** | **9.3** | **13.6** | **45.5** | **0.2** |
| **මුළු අපනයන** | **11,940.0** | **10,047.4** | **6,445.0** | **7,903.0** | **22.6** | **100.0** |
| **ආනයන** | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **3,956.5** | **3,401.7** | **2,300.3** | **2,579.3** | **12.1** | **19.2** |
| ආහාර හා පාන වර්ග | 1,426.9 | 1,554.4 | 1,023.7 | 1,151.9 | 12.5 | 8.6 |
| සහල් | 12.8 | 10.5 | 6.3 | 8.4 | 34.2 | 0.1 |
| සීනි | 199.7 | 276.0 | 161.9 | 210.5 | 30.0 | 1.6 |
| කිරි නිෂ්පාදිත | 311.9 | 333.8 | 228.9 | 231.2 | 1.0 | 1.7 |
| පරිප්පු | 79.9 | 96.9 | 65.7 | 105.7 | 60.8 | 0.8 |
| වෙනත් | 822.7 | 837.2 | 560.8 | 596.1 | 6.3 | 4.4 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 2,529.6 | 1,847.3 | 1,276.7 | 1,427.3 | 11.8 | 10.6 |
| පෞද්ගලික රථවාහන | 815.7 | 282.9 | 280.8 | 7.8 | -97.2 | 0.1 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 552.6 | 595.5 | 385.3 | 532.0 | 38.1 | 4.0 |
| ගෘහ උපකරණ | 206.6 | 174.2 | 100.4 | 179.8 | 79.1 | 1.3 |
| රෙදිපිළි හා උපාංග | 275.1 | 200.7 | 137.6 | 138.7 | 0.8 | 1.0 |
| වෙනත් | 679.6 | 594.0 | 372.5 | 569.0 | 52.7 | 4.2 |
| **අන්තර් භාණ්ඩ** | **11,369.6** | **9,076.5** | **5,692.4** | **7,942.4** | **39.5** | **59.2** |
| ඉන්ධන | 3,891.6 | 2,542.6 | 1,691.2 | 2,395.9 | 41.7 | 17.9 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,909.4 | 2,335.1 | 1,457.2 | 1,943.7 | 33.4 | 14.5 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 201.4 | 117.2 | 57.4 | 81.7 | 42.3 | 0.6 |
| රසායනික නිෂ්පාදිත | 831.5 | 831.5 | 518.3 | 732.6 | 41.3 | 5.5 |
| තිරිඟු හා ඉරිඟු | 346.4 | 384.4 | 229.3 | 265.9 | 15.9 | 2.0 |
| පොහොර | 221.4 | 258.9 | 124.3 | 104.0 | -16.4 | 0.8 |
| මූල ලෝහ | 562.8 | 460.3 | 246.6 | 499.2 | 102.4 | 3.7 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 612.9 | 540.2 | 323.9 | 518.6 | 60.1 | 3.9 |
| අනෙකුත් අන්තර් භාණ්ඩ | 1,792.3 | 1,606.3 | 1,044.2 | 1,400.9 | 34.2 | 10.4 |
| **ආයෝජන භාණ්ඩ** | **4,602.6** | **3,563.2** | **2,253.2** | **2,882.3** | **27.9** | **21.5** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,489.7 | 2,176.1 | 1,324.6 | 1,822.5 | 37.6 | 13.6 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,508.7 | 1,035.6 | 671.4 | 803.9 | 19.7 | 6.0 |
| ප්‍රවාහන උපකරණ | 596.6 | 348.3 | 255.3 | 252.1 | -1.2 | 1.9 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 7.6 | 3.2 | 2.0 | 3.7 | 90.6 | 0.03 |
| **වර්ග නොකළ ආනයන** | **8.3** | **14.0** | **11.4** | **7.6** | **-33.8** | **0.1** |
| **මුළු ආනයන** | **19,937.1** | **16,055.4** | **10,257.4** | **13,411.5** | **30.7** | **100.0** |

(අ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් හා ස්වර්ණාභාරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

බලපෑම විවිධ වූ නමුත්, සාමාන්‍යයෙන් ආනයන වියදම පරිමා සහ මිල ගණන් ඉහළ යෑම යන දෙඅංශයේම බලපෑමට ලක් විණි.


2020 වසරට සාපේක්ෂව අපනයන ක්‍රියාකාරීත්වය සමස්තයක් ලෙස වර්ධනයක් පෙන්නුම් කළේය. කාර්මික, කෘෂිකාර්මික සහ ඛනිජ අපනයන අංශ හරහා සිදු කෙරෙන අපනයන සියල්ලම පාහේ ඉහළ යෑම් වාර්තා කළේය. කොවිඩ්-19 වසංගතයේ බලපෑම් ගෝලීය වශයෙන් සම්පූර්ණයෙන්ම පහව ගොස් නැති නමුත්, දියුණු ආර්ථිකයන්හි වර්ධනය ශ්‍රී ලංකාවේ අපනයන අපේක්ෂිත මට්ටමට වඩා වේගයෙන් යථා තත්ත්වයට පත් වීමට හේතු විය. දේශීය වශයෙන්, රජය විසින් සපයන ලද සහයෝගය වසංගතය මධ්‍යයේ කර්මාන්ත මුහුණ දෙන ගැටලු විසඳීමට උපකාරී වූ අතර ව්‍යාපාර සඳහා යටිතල පහසුකම් සහ ආධාරක සේවාවන් අඛණ්ඩව සැපයීම තුළින් මෙම වර්ධනය වාර්තා කිරීමට හැකි විය.

2020 වසරේ දී රජය විසින් පනවන ලද ඇතැම් ආනයන සීමා තවදුරටත් පැවතිය ද, ආනයන වියදම ඉහළ ගියේය. ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීම හේතුවෙන් සහ ඉන්ධන මිල ඇතුළු ගෝලීය මිල ගණන් ඉහළ යෑමත් සමඟ පාරිභෝගික භාණ්ඩ, ආයෝජන භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ යන සියලුම ප්‍රධාන අංශවල ආනයන වියදම් ඉහළ ගියේය.

### සේවා ගිණුම

තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ අංශයෙහි හිතකර වර්ධනයක් පැවතිය ද සංචාරක ඉපැයීම් සීමිත වීම සමඟින්, 2021 වසරේ පළමු භාගයේ දී සේවා අංශය මන්දගාමීව පැවතුණි. සංචාරක අංශය තුළ සීමිත සංචාරක පැමිණීම් සංඛ්‍යාවක් වාර්තා විය. 2021 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා පැමිණි මුළු සංචාරකයින් ප්‍රමාණය 37,924ක් වූ අතර එම කාලපරිච්ඡේදය තුළ සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 51කට සීමා විය. වසංගතයේ බලපෑම අවම කිරීම සඳහා මහ බැංකුව, රජය සහ සංචාරක අංශයේ බලධාරීන් සංචාරක අංශය වෙත සැලකිය යුතු සහයෝගයක් ලබා දුන්හ. ණය ආපසු ගෙවීම සඳහා සහන කාලයක් ලබා දීම, කාරක ප්‍රාග්ධන ණය ලබා දීම, බලපත්‍ර ගාස්තු කපා හැරීම, ඩිජිටල් නොමැඩිවරු (දුර ස්ථානවල සිට තාක්ෂණය හරහා වැඩ කරන පිරිස්) ගෙන්වීමේ ව්‍යාපාරය වැනි නව සංචාරක ප්‍රවණතා සඳහා පහසුකම් ඇති කිරීම, ඉලක්ක වෙළඳපොළ තුළ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම, සංචාරකයින් සඳහා ජංගම යෙදුම් සංවර්ධනය කිරීම, දෘඪ හා මෘදු සංචාරක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම යනාදිය මීට ඇතුළත් ය.

**5.4 රූප සටහන**
**ගෙවුම් තුලනය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

> **සංචාරක ඉපැයීම් පහළ යෑම ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින්, සේවා වෙළඳාමේ අතිරික්තය අඩු විය...**

**5.2 සංඛ්‍යා සටහන**
**ජංගම සහ ප්‍රාග්ධන ගිණුම**

එ.ජ.ඩො. මිලියන

| ශීර්ෂය | 2019 (අ) | 2020 (ආ) | 2020 පළමු භාගය (ආ) | 2021 පළමු භාගය (ආ) |
|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | **-7,997** | **-6,008** | **-3,262** | **-4,316** |
| අපනයන | 11,940 | 10,047 | 4,413 | 5,699 |
| *වර්ධනය (%)* | *0.4* | *-15.9* | *-26.4* | *29.1* |
| ආනයන | 19,937 | 16,055 | 7,675 | 10,015 |
| *වර්ධනය (%)* | *-10.3* | *-19.5* | *-20.0* | *30.5* |
| | | | | |
| **සේවා (ශුද්ධ)** | **2,849** | **819** | **729** | **549** |
| ලැබීම් | 7,474 | 3,035 | 2,036 | 1,372 |
| එයින්; | | | | |
| ප්‍රවාහන (ශුද්ධ) | 630 | 114 | 145 | 185 |
| *වර්ධනය (%)* | *-16.0* | *-81.8* | *-59.2* | *27.4* |
| සංචාරක ඉපැයීම් | 3,607 | 682 | 682 | 23 |
| *වර්ධනය (%)* | *-17.7* | *-81.1* | *-64.1* | *-96.7* |
| තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම | 899 | 971 | 486 | 576 |
| *වර්ධනය (%)* | *6.1* | *8.0* | *6.4* | *18.4* |
| ගෙවීම් | 4,625 | 2,216 | 1,307 | 823 |
| | | | | |
| **ප්‍රාථමික ආදායම් ගිණුම (ශුද්ධ)** | **-2,462** | **-2,101** | **-1,101** | **-957** |
| ලැබීම් | 252 | 198 | 111 | 69 |
| ගෙවීම් | 2,713 | 2,300 | 1,212 | 1,026 |
| | | | | |
| **ද්විතීයික ආදායම් ගිණුම (ශුද්ධ)** | **5,766** | **6,207** | **2,580** | **3,187** |
| එයින්; | | | | |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 6,717 | 7,104 | 2,980 | 3,324 |
| *වර්ධනය (%)* | *-4.3* | *5.8* | *-8.9* | *11.6* |
| | | | | |
| **ජංගම ගිණුමේ ශේෂය** | **-1,843** | **-1,083** | **-1,054** | **-1,536** |
| | | | | |
| **ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **23** | **28** | **16** | **11** |
| **ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **-1,820** | **-1,055** | **-1,037** | **-1,525** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වසංගතය හේතුවෙන් වර්ධනය වූ ව්‍යාපාර අවස්ථා පිළිබිඹු කරමින්, පරිගණක සහ තොරතුරු සේවා උප අංශය 2021 වසරේ පළමු භාගයේ දී සේවා ඉපැයීම් සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. මේ අතර, මෘදුකාංග වැඩිදියුණු කිරීමේ සේවාවලට අමතරව ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සහ දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ සේවා ඇතුළත් තොරතුරු තාක්ෂණය මත පදනම් වූ සේවා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම මෙම අංශයේ හිතකර වර්ධනය සඳහා අඛණ්ඩව හේතු විය. ගෝලීය හා දේශීය වශයෙන් ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ යෑම සහ භාණ්ඩ හැසිරවීම් සඳහා වන ගෝලීය තීරු බදු ඉහළ යෑම හේතුවෙන්, වරාය සේවා උප අංශයේ බහලුම් හැසිරවීම් සහ භාණ්ඩ හැසිරවීම් වසර තුළ දී අඛණ්ඩ වර්ධනයක් වාර්තා කිරීමත් සමඟ ප්‍රවාහන අංශයෙන් ලැබෙන ශුද්ධ ආදායම 2021 වසරේ පළමු භාගයේ දී ක්‍රමයෙන් ඉහළ ගියේය.

### ප්‍රාථමික ආදායම් සහ ද්විතියික ආදායම් ගිණුම්

සෘජු ආයෝජන ව්‍යාපාරවල ලාභාංශ ගෙවීම් මෙන්ම රජය විසින් විදේශීය ණය සම්බන්ධයෙන් වන පොලී ගෙවීම් ද 2020 වසරේ පළමු භාගයේ වාර්තා වූ මට්ටමට සාපේක්ෂව පහළ අගයක පැවතීම හේතුවෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය සුළු වශයෙන් අඩු විය. විදේශිකයින් සතු රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත්වල නොපියවා ඉතිරිවූ සීමිත වගකීම් සහ කල්පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආපසු ගෙවීම හේතුවෙන් පොලී ගෙවීම් අඩු විය.

> ***මුදල් ප්‍රේෂණය කිරීම සඳහා අවිධිමත් මාර්ග භාවිතා කිරීම ඉහළ යෑම යම් ප්‍රමාණයකට හේතු වීමෙන් 2021 වසරේ ජූනි මාසයේ සිට විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස පහළ ගියේය...***

2021 වසරේ මැයි මාසයෙන් අවසන් වන මාස පහ තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල වර්ධනය සාපේක්ෂව ඉහළ මට්ටමක පැවති අතර එය ද්විතීයික ආදායම් ගිණුමට හිතකර ලෙස දායක විය. කෙසේ වෙතත්, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි පීඩන මධ්‍යයේ මුදල් ප්‍රේෂණය කිරීම සඳහා අවිධිමත් ක්‍රම භාවිතා කිරීමේ හැකියාව ඉහළ යෑම පිළිබිඹු කරමින්, 2021 වසරේ ජූනි මාසයේ සිට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මන්දගාමී විය. කෙසේ වුව ද, වසංගතය ක්‍රමයෙන් පහව යෑමත් සමඟ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි ලියාපදිංචි වන රැකියා සඳහා විදේශගතවන්නන්ගේ ප්‍රමාණය මාසිකව ඉහළ යෑම සමඟ විදේශ සේවා සඳහා සංක්‍රමණය වීමේ වර්ධනයක් පෙන්නුම් කළේය. තවද, බැංකු පද්ධතියට වැඩි වශයෙන් විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් බලපත්‍රලාභී බැංකුවල ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සඳහා වෙළඳපොළෙහි පවතින අනුපාතිකයට වඩා එ.ජ. ඩොලරයට අමතර රුපියල් 2ක් රජය විසින් ගෙවීම අඛණ්ඩව සිදු කරන ලදී. මීට අමතරව, ඉහළ ප්‍රේෂණ ලැබීම් ආකර්ෂණය කර ගැනීම සඳහා 2020 වසරේ දී හඳුන්වා දුන් විශේෂ තැන්පතු ගිණුම් යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම මගින්, රට වෙත විදේශ විනිමය ගලා ඒම තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පාර්ශ්වකරුවන්ගේ සක්‍රිය සහභාගීත්වය තුළින් විදේශ රැකියා ප්‍රවර්ධනය කිරීමෙන් වැඩි විදේශ රැකියා අවස්ථා ප්‍රමාණයක් සුරක්ෂිත කර ගැනීමට අපේක්ෂා කරන අතර, එමගින් ඉදිරි කාලය තුළ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් ශක්තිමත් වනු ඇත.

### මූල්‍ය ගිණුම

2021 වසරේ පළමු භාගයේ දී මූල්‍ය ගිණුම වෙත සීමිත ලැබීම් වාර්තා විය. සෘජු ආයෝජන ව්‍යාපාර වෙත වූ විදේශීය ණය ද ඇතුළු විදේශීය සෘජු ආයෝජන 2020 වසරේ දී සහ 2021 වසරේ පළමු භාගයේ දී ද මධ්‍යස්ථව පැවතුණි. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජනයන්හි ශුද්ධ ගෙවීම් වාර්තා විය. 2021 වසරේ අප්‍රේල් මාසයේ දී චීන සංවර්ධන බැංකුවෙන් ලැබුණු ඒකාබද්ධ ණය පහසුකමේ දෙවන වාරිකය, වසරේ පළමු භාගයේ දී ලැබුණු ප්‍රධාන මූල්‍ය ලැබීම විය. එතැන් සිට, අගෝස්තු මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් ලැබුණු විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම්, අගෝස්තු මාසයේ දී බංගලාදේශ බැංකුව සමඟ එළඹුණු ද්විපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකම සහ චීන සංවර්ධන බැංකුව වෙතින් ලැබුණු ඒකාබද්ධ ණය පහසුකමෙහි ඉතිරි කොටසට අදාළ මූල්‍ය ලැබීම් ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම ශක්තිමත් කළේය. තව ද, 2021 වසරේ මාර්තු මාසයේ දී මහ බැංකුව, චීන මහජන බැංකුව සමඟ දළ වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.5කට සමාන ද්විපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකමකට එළඹුණු අතර, එය පූර්වාරක්ෂණයක් ලෙස පවත්වා ගනියි. ප්‍රධාන වශයෙන්, රටේ විදේශීය ණය සේවාකරණ වගකීම් හේතුවෙන්,

**5.3 සංඛ්‍යා සටහන**

**මූල්‍ය ගිණුම**

එ.ජ.ඩො. මිලියන

| ශීර්ෂය | 2019 (අ) | 2020 (ආ) | 2020 පළමු භාගය (ආ) | 2021 පළමු භාගය (ආ) |
|---|---|---|---|---|
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **-2,460** | **-260** | **-693** | **-1,920** |
| **මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්** | **514** | **-1,825** | **-1,566** | **-1,535** |
| සෘජු ආයෝජන | 77 | 15 | 7 | 9 |
| අනෙකුත් ආයෝජන | 100 | -136 | -58 | 37 |
| මුදල් සහ තැන්පතු | -93 | 64 | 22 | -52 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | -4 | -224 | -137 | 100 |
| අනෙකුත් ලැබිය යුතු ගිණුම් | 196 | 24 | 58 | -11 |
| සංචිත වත්කම් | 337 | -1,704 | -1,515 | -1,581 |
| **මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම්** | **2,974** | **-1,566** | **-873** | **385** |
| සෘජු ආයෝජන | 743 | 434 | 242 | 302 |
| විවිධ ආයෝජන | 2,313 | -2,383 | -771 | -84 |
| හිමිකම් | -4 | -217 | -103 | -116 |
| ණය සුරැකුම් | 2,317 | -2,166 | -669 | 32 |
| අනෙකුත් ආයෝජන | -82 | 383 | -344 | 167 |
| මුදල් සහ තැන්පතු | 167 | -15 | -636 | -177 |
| ණය | -245 | 327 | 723 | -12 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | -28 | 185 | -248 | 238 |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් | 24 | -114 | -183 | 118 |
| **වැරදීම් සහ අත්හැරීම්** | **-640** | **795** | **344** | **-395** |
| **සමස්ත ශේෂය** | **377** | **-2,328** | **-760** | **-1,261** |
| **දළ නිල සංචිත** | **7,642** | **5,664** | | **4,060** |
| ආනයනික මාස | 4.6 | 4.2 | | 2.6 |
| **මුළු විදේශීය සංචිත** | **10,402** | **8,521** | | **6,824** |
| ආනයනික මාස | 6.3 | 6.4 | | 4.5 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


මූල්‍ය ගිණුම වෙතින් වන ගෙවීම්, ලැබීම්වලට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවතුණි. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් කල් පිරීම ඇතුළත් වූ 2021 වසරේ මේ දක්වා කාලය තුළදී, සැලකිය යුතු විදේශීය ණය සේවාකරණ ගෙවීම් සිදු කෙරිණි. මූල්‍ය ගිණුම වෙත අනාගතයේ දී අපේක්ෂිත ලැබීම් අතර කොළඹ වරාය නගර ව්‍යාපෘතියේ ආයෝජන තුලින් සැලකිය යුතු දායකත්වයක් අපේක්ෂා කෙරේ. බලශක්ති අංශය වෙත රජය මේ වන විටත් විදේශීය සෘජු ආයෝජන සුරක්ෂිත කර ඇති අතර, නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ඇති ඌන උපයෝජිත වත්කම්වලින් මුදල් රැස්කිරීම සඳහා ද කටයුතු කරමින් සිටී. තවද, 2021 වසරේ ඔක්තෝබර් මාසය ආරම්භයේ දී ප්‍රකාශයට පත් කරන ලද මහ බැංකුවේ සය මාසික පෙර දැක්මෙහි විස්තර කර ඇති පරිදි, ඉදිරි මාස හය තුළ සාර්ථකව කටයුතු කිරීමට මෙන්ම මැදි කාලීනව සහ දිගු කාලීනව විදේශීය අංශයේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා, රජය සහ මහ බැංකුව කෙටි කාලීනව අරමුදල් ලැබෙන ප්‍රභවයන් ගණනාවක් මෙන්ම ණය නොවන ක්‍රම හෝ අඩු වියදම් සහිත දිගු කාලීන මූල්‍යනයන් හඳුනාගෙන ඇත. තවද, ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය පිටුදැකීම සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකාය යටතේ පිහිටුවන ලද විදේශ විනිමය ලැබීම් ශක්තිමත් කිරීමේ කාර්ය සාධක බලකාය, තෝරාගත් භාණ්ඩ හා සේවා අපනයන අංශ, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, විදේශීය ආයෝජන යනාදී හඳුනාගත් අංශවල පාර්ශ්වකරුවන්ට පහසුකම් සැලසීමට අඛණ්ඩව කටයුතු කළේය. එවැනි හඳුනාගත් අංශ වෙත විදේශීය ලැබීම් ඉදිරි කාලපරිච්ඡේදය තුළ ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත බලාත්මක කිරීමෙන්, හිමිකම් කොටස් සහ විවිධ ආයෝජන සඳහා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කෙරේ.

## 5.2 සමස්ත ශේෂය සහ දළ නිල සංචිත

ගෙවුම් තුලනයෙහි සමස්ත ශේෂය 2021 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ සැලකිය යුතු හිඟයක් වාර්තා කළේය. ජංගම ගිණුමේ හිඟය පුළුල් වීම, මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් සීමිත වීම සහ ඉහළ විදේශීය ණය සේවාකරණ ගෙවීම් යම් ප්‍රමාණයක් දළ නිල සංචිත යොදා ගැනීමෙන් සිදු කිරීම හේතුවෙන් 2021 වසරේ සැප්තැම්බර් මාසය අවසාන වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 2.7ක් දක්වා පහළ ගිය අතර, මෙම දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 1.7කට සමාන වන බවට ඇස්තමේන්තු කර ඇත. මෙම දළ නිල සංචිත මට්ටම තුළ චීන මහජන බැංකුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර වූ දළ වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.5ක තුන් අවුරුදු ද්විපාර්ශ්වික මුදල් හුවමාරු පහසුකම ඇතුළත් නොවේ. මේ අතර, අපනයන ආදායම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ශ්‍රී ලංකා රුපියල්වලට හැරවීම් මත විදේශ විනිමය අවශෝෂණය කර ගැනීම හේතුවෙන් මහ බැංකුවට ණය නොවන මූලාශ්‍ර හරහා දළ නිල සංචිත යම් දුරකට ශක්තිමත් කිරීමට හැකි විය.

**5.5 රූප සටහන**

**දළ නිල සංචිත සහ ආනයනික මාස**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත මුළු ජාත්‍යන්තර සංචිත ප්‍රමාණය 2021 වසරේ සැප්තැම්බර් මාසය අවසාන වන විට එ.ජ. ඩොලර් බිලියන 6.1ක් වූ අතර, එම ප්‍රමාණය මාස 3.8ක ආනයන ආවරණය කිරීමට ප්‍රමාණවත් වන බවට ඇස්තමේන්තු කර ඇත.

## 5.3 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

2021 වසරේ ජූනි මාසය අවසාන වන විට අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි ශුද්ධ වගකීම් තත්ත්වය වැඩි වීමක් වාර්තා කළේය. වසර ආරම්භය හා සසඳන විට, 2021 වසරේ ජූනි මාසය අවසාන වන විට අනේවාසිකයින් සමග සිදු කළ ගනුදෙනු හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම් ප්‍රමාණය අඩු විය. මූලික වශයෙන්, දළ නිල සංචිත ප්‍රමාණය පහත වැටීම හේතුවෙන් විදේශීය වත්කම් තත්ත්වය පහළ ගියේය. ප්‍රධාන වශයෙන්, ශ්‍රී ලංකාවෙහි නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ මිල ඉහළ යෑම හේතුවෙන් වසර ආරම්භය හා සසඳන විට, 2021 වසරේ ජූනි මාසය අවසාන වන විට, අනේවාසිකයින් වෙත වන ශ්‍රී ලංකාවේ සමස්ත වගකීම් තත්ත්වය ඉහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය තුළ විදේශීය සෘජු ආයෝජන ව්‍යාපාරවල සෘජු ආයෝජන වගකීම් තත්ත්වය ද සුළු වශයෙන් ඉහළ ගියේය. තැන්පතු භාර ගන්නා ආයතනවල විදේශීය ණය වගකීම් පහළ ගිය අතර, රජයේ විදේශීය ණය වගකීම් සහ පෞද්ගලික අංශයේ සමාගම් හා රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත ලැබුණු වෙළඳ ණයවල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය ඉහළ ගියේය. මේ අතර, ප්‍රධාන වශයෙන්, 2021 වසරේ පෙබරවාරි මාසයේ දී ඉන්දියානු සංචිත බැංකුව සමග එළඹුණු විදේශ විනිමය හුවමාරු පහසුකම පියවීමත් සමග මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති වගකීම් පහත වැටුණි.

## 5.4 විදේශීය ණය තත්ත්වය

ප්‍රධාන වශයෙන්, ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, 2020 වසර අවසානය හා සසඳන විට 2021 වසරේ පළමු භාගයේ දී ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ණය ඉහළ ගියේය. වසරේ පළමු භාගය තුළ රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ද සුළු වශයෙන් ඉහළ ගියේය. මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් ද ඉහළ ගියේය. මුදල් හා තැන්පතු තත්ත්වය ඉහළ ගිය ද, නොපියවා ඉතිරිව ඇති කෙටිකාලීන ණය සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන්, බැංකු අංශයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය අඩු විය. පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය සුළු වශයෙන් පහළ ගිය නමුත්, රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් ලබා ගත් වෙළඳ ණය සහ අත්තිකාරම් ඉහළ යෑම හේතුවෙන්, පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායන්ගේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය සහ වගකීම් ප්‍රමාණය ඉහළ ගියේය. කෙසේ වෙතත්, වසරේ පළමු භාගය තුළ දී සෘජු ආයෝජන ව්‍යාපාරවල අන්තර් සමාගම් ණය ඉහළ යෑමක් වාර්තා කළේය. 2020 සහ 2021 වසරවල දී කල් පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආපසු ගෙවීමත් සමග දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ශේෂය, සැළකිය යුතු ලෙස අඩු විය. රජයේ මූල්‍යන උපායමාර්ගයට අනුව, ඉදිරි කාලය තුළ දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රමාණය තවදුරටත් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**5.4 සංඛ්‍යා සටහන**

**නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය**

එ.ජ.ඩො. මිලියන

| ශීර්ෂය | 2019 (අ) | 2020 (ආ) | 2021 පළමු භාගය (ආ) |
|---|---|---|---|
| **දළ විදේශීය ණය තත්ත්වය (වෙළෙඳපොළ අගය මත පදනම්ව)** | **54,811** | **49,212** | **50,438** |
| රජය | 34,249 | 28,187 | 29,670 |
| මහ බැංකුව | 2,318 | 2,690 | 2,342 |
| තැන්පතු භාරගන්නා ආයතන | 6,997 | 6,657 | 6,511 |
| අනෙකුත් අංශ | 6,469 | 6,676 | 6,768 |
| මුදල් සහ තැන්පතු | | | |
| සෘජු ආයෝජනː අන්තර් සමාගම් ණය | 4,778 | 5,001 | 5,148 |
| **විශේෂිත අයිතමයන්** | | | |
| රජයේ දළ විදේශීය ණය තත්ත්වය (මුහුණත අගය මත පදනම්ව) | 34,084 | 32,452 | 32,928 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

*මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව*

## 5.5 විනිමය අනුපාතිකයේ හැසිරීම

දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි පීඩනය ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ අප්‍රේල් මාසයෙන් අවසන් වන මාස හතර තුළ සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වූ ශ්‍රී ලංකා රුපියල, යම් විචලනයන් මධ්‍යයේ වුව ද, සාපේක්ෂ වශයෙන් ස්ථාවරත්වයක් පසුව පිළිබිඹු කළේය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කළ දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීම සහ ශිෂ්ට ප්‍රයෝග රුපියල ස්ථාවර වීමට ආධාර විය. ඒ අනුව, අන්තර් බැංකු වෙළඳපොළෙහි බර තැබූ සාමාන්‍ය

**5.5 සංඛ්‍යා සටහන**


**විනිමය අනුපාතික වෙනස්වීම්**

| මුදල් වර්ගය | කාල පරිච්ඡේදය අග අනුපාතිකය - විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය | | වෙනස (%) |
|---|---|---|---|
| | **2020** | **2021** - සැප්. | |
| යූරෝ | 229.42 | 232.10 | -1.16 |
| ඉන්දියානු රුපියල් | 2.55 | 2.69 | -5.32 |
| ජපන් යෙන් | 1.81 | 1.79 | 1.10 |
| බ්‍රිතාන්‍ය පවුම් | 254.35 | 268.96 | -5.43 |
| එක්සත් ජනපද ඩොලර් | 186.41 | 199.99 | -6.79 |
| විශේෂ ගැනුම් හිමිකම් | 268.48 | 281.75 | -4.71 |
| සඵල විනිමය අනුපාතික දර්ශක (2017=100) | | | |
| නා.ස.වි.අ. - මුදල් වර්ග 24 පැස අනුව | 83.12 | 78.76 | -5.25 |
| මූ.ස.වි.අ. - මුදල් වර්ග 24 පැස අනුව | 88.37 | 83.99 | -4.95 |

*මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව*

**5.6 රූප සටහන**

**විනිමය අනුපාතිකයේ වෙනස්වීම**




*මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව*

එතැන් විනිමය අනුපාතිකය, එ.ජ. ඩොලරයට රුපියල් 200ක් පමණ වන පරිදි සමස්තයක් ලෙස ස්ථාවරව පැවතුණි. 2021 වසරේ සැප්තැම්බර් මාසය අවසාන වන විට එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 6.8%කින් අවප්‍රමාණය විය. විදේශ විනිමය ඉපැයීම් ප්‍රමාණවත් ලෙස රුපියල්වලට පරිවර්තනය නොකිරීම, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ නිරීක්ෂණය වූ පීඩනවලට යම්තාක් දුරකට හේතු විය. අපනයන ආදායම් රුපියල්වලට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවයට අදාළ රෙගුලාසි අඛණ්ඩව ක්‍රියාත්මක වීමත් සමග දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි විදේශ විනිමය ද්‍රවශීලතා තත්ත්වය ඉදිරි කාලසීමාව තුළ තරමක් දුරට වැඩි දියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මහ බැංකුව විසින් සය මාසික පෙර දැක්ම ප්‍රකාශයට පත් කිරීමෙන් පසු, විනිමය අනුපාතිකය පිළිබඳ අනවශ්‍ය සමපේක්ෂන පීඩන බොහෝ දුරට අඩු වී ඇත. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම් පිළිබිඹු කරමින්, 2021 වසරේ සැප්තැම්බර් මාසය අවසාන වන විට, ජපන් යෙන්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වූ අතර, ස්ටර්ලින් පවුම, යූරෝ සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අවප්‍රමාණය විය.

> ***මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකවලින් පිළිබිඹු වන පරිදි, ශ්‍රී ලංකා රුපියලෙහි අගය පිරිහීමකට ලක්ව ඇත...***

ව්‍යවහාර මුදල් වර්ග කිහිපයකින් සැදුම්ලත් පැසකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ හැසිරීම මනිනු ලබන නාමික සඵල විනිමය අනුපාතික (නා.ස.වි.අ) සහ මූර්ත සඵල විනිමය අනුපාතික (මූ.ස.වි.අ) දර්ශක 2021 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ පහළ ගියේය. සමස්තයක් වශයෙන්, මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක, පදනම් වර්ෂයේ (2017=100) සීමාවට වඩා අඩු අගයක පැවතුන අතර, එමගින් රටෙහි වෙළඳ තරඟකාරීත්වයට සහාය වන අයුරින් විනිමය අනුපාතිකය පැවති බව පිළිබිඹු වේ.